**සිරකරු සුභසාධක අරමුදල - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

සිරකරු සුභසාධක අරමුදලේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනතුලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතවඋචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලද ජංගම නොවන වත්කම් 2021 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමේ අරමුණින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර 2020 වර්ෂය සඳහා නැවත ප්‍රකාශ කර 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 54 ඡේදයට අනුගතව කටයුතු කර නොතිබුණි. | නැවත ප්‍රකාශ කරන ලද ගිණුමක් වෙනමම ඉදිරිපත් කළ බැවින් 2021 වර්ෂයේ ඉදිරිපත් කරන ලද ගිණුමෙහි විස්තරාත්මක හෙළිදරව් කිරීමක් සිදු නොකළ අතර ඒ පිළිබඳව කෙටි හෙළිදරව් කිරීමක් පමණක් අංක 12 මගින් සිදු කර ඇත. | පෙර කාලපරිච්ඡේදයේ වැරදි නිවැරදි කිරීමට අදාළව නැවත ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක03 හි 54 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර ආයතන වෙත ලැබෙන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන | පරිත්‍යාග වශයෙන් ලැබෙන පාරිභෝජ්‍ය වත්කම් සිරකරුවන්ගේ පරිහරණය සඳහා පරිත්‍යාග කරන භාණ්ඩ | පාරිභෝජ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ |

| | | |
|---|---|---|
| නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,275,460ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලැබීම් හා තොග මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වන අතර එම භාණ්ඩ සිරකරුවන්ගේ පරිහරණය සඳහා ලබා දීමට කටයුතු කරයි. එහිදි එම භාණ්ඩ පරිභෝජනය අවසන් වීම හේතුවෙන් ඒවා තොග ලෙස අවසන් ගිණුමට ගැලපීම් සිදු නොකරයි. එසේ වුවත් පාරිභෝගික වත්කම් ගබඩාවට ලබාගෙන බෙදා හැරීම සිදු කර ඇත. | ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතුය. |

**1.5.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වත්කම් ප්‍රත්‍යාගණනය | 24,350,099 | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශකර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ක්ෂය ගැලපීමට පෙර ජංගම නොවන වත්කම්වල වටිනාකම රු. 11,709,369 ක් වුවද, නැවත ප්‍රකාශ කළ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ඉවත් කිරීමේ අතිරික්තය රු.12,640,730 ක් ගැලපීමෙන් පසු ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.24,350,099 ක් ලෙස දක්වා තිබුණි. නමුත් මෙම වත්කම් නැවත ප්‍රකාශ කිරීමට පෙර පැහැදිළිවම භෞතිකව හඳුනාගෙන ඒවා සත්‍ය වශයෙන්ම ප්‍රත්‍යාගණනය කළ බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවීය. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ 21/2021 අනුව 2021 වර්ෂයේ සිට සියළුම වත්කම් සමස්ථයක් ලෙස ගෙන භාණ්ඩ සමීක්ෂණය සිදු කර ඇති අතර, භෞතිකව හඳුනාගත හැකි සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර සිගාස් වැඩසටහන තුළට ඇතුළත් කර ඇත. | වත්කම් නැවත ප්‍රකාශ කිරීමට පෙර එම වත්කම් පැහැදිළිවම භෞතිකව හඳුනාගෙන ඒවා සත්‍ය වශයෙන්ම ප්‍රත්‍යාගණනය කළ බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ජාතික රාජ්‍ය සභාවේ 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ සංශෝධන | 6000-0-0-006-0-081-0 පොදු තැන්පතු ගිණුමේ වර්ෂයකට වැඩි රු.4,324,428 ක මුදලක් පැවතිය ද එම මුදල තුළ ඇතුළත්ව | තැන්පත් ගිණුමේ ඇති මුදල පිළිබඳව එම සිරකරුවන් මුදා හැර ඇද්ද මුදා හැරීමෙන් පසු ගත වී ඇති කාලය පිළිබඳව විස්තර ලබා ගැනීමට | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පනත 4 "අ"වගන්තිය | තිබූ, සිරකරු මුදාහරිනු ලැබූ දිනයේ සිට වර්ෂයකට නොඅඩු කාලයක් තුළ හිමිකම්පානු නොලැබූ මුදල් ප්‍රමාණය හඳුනාගෙන අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කිරීමෙන් පසුව එම මුදල ආදායමක් ලෙස සිරකරු සුභසාධක ගිණුමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි | | | |
| (i.) | මු. රෙ. 876 (2) (ආ) | සමාලෝචිත වර්ෂයේදී ද අරමුදල මගින් සිරකරු සුභසාධනය සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයෙන් වැය විෂයයන් 03 ක් යටතේ රු.1,721,729,057 ක් වැයකර තිබුණි. ඒ අනුව අපේක්ෂිත අරමුණු රාජ්‍ය අයවැය යටතේ ඉටුකරගත හැකි බව හෝ අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේයැයි හෝ පෙනී යන්නේනම් එම අරමුදලේ කටයුතු අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. නමුත් ඊට අනුගතව කටයුතු කර නොතිබුණි. | මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යන්නේ ද යන්න පිළිබඳව කොමසාරිස් (පුනරුත්ථාපන) හා නැවතත් සාකච්ඡා කිරීමට සටහන් කරගත් අතර එම තීරණය මත ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. | ආදායම් මාර්ග වැඩි කර ගැනීම හෝ අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ නම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii.) | මු.රෙ. 877 (2) (අ) | අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා නොමැති අතර සුභසාධක අරමුදලේ ගණුදෙනු දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම යටතේ ඉටුකරගෙන තිබුණි. | මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යන්නේ ද යන්න පිළිබඳව සාකච්ඡාවෙමින් පවතින අතර එසේ පවත්වාගෙන යාමට තීරණය වුවහොත් 2022 වර්ෂයේ දී ඒ සඳහා බැංකු ගිණුමක් විවෘත කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි 877(2)(අ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1. මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.908,830 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.735,004 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.173,826 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම රු.173,826 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධන

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිරකරු සුභසාධක අරමුදලක් පිහිටුවීම, සිරකරුවන්ගේ පොදු ශුභ සිද්ධිය සඳහා එයින් වියදම් දැරීමහා ඊට සම්බන්ධ අනුෂාංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනත පිහිටුවා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ අරමුදලට ලැබීම් රු.908,830 ක්ද ඇතුලුව අරමුදලේ රු.4,527,464 ක ශේෂයක් පැවතියද පනතේ 5 වගන්තිය අනුව සිරකරු සුභසාධක අරමුදලේ කාර්යභාරය වන සිරකරුවන් වෙනුවෙන් සුභසාධන වැඩසටහන් පැවැත්වීම සඳහා ඉන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකරන ලද නමුත් අරමුදලේ පරමාර්ථයන් යම්තාක් දුරකට හෝ ඉටු කර ගැනීම සඳහා බාහිර ආයතන හා ස්වේච්ඡා සංවිධානවල අනුග්‍රහයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අරමුදලේ ප්‍රගතිය මැනීම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දී නොතිබූ අතර බන්ධනාගාරවල පැවැත්විය යුතු වැඩසටහන්වල ස්වභාවය, සහභාගි කළ යුතු සිර/ සැකකරුවන් සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය ඇතුළත්ව පූර්ව සැලසුම් සකස්කර එම සැලැසුම්වලට අනුව ප්‍රගතිය වාර්තා නොකිරීම නිසා අරමුදලේ අරමුණු ඉටුකිරීමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ වැය දැරීමට ප්‍රමාණවත් අරමුදල් නොතිබීමෙන් ඇති වූ තත්ත්වය මත සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකළ අතර මෙම අරමුදල පවත්වාගෙන යන්නේ නම් ඉදිරියේ දී තවදුරටත් අරමුදලේ ප්‍රගතිය මැනීම සඳහා කාර්යසාධක දර්ශක හඳුන්වා දීමට කටයුතු කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත උපදෙස් ලබා දීමට සටහන් කර ගතිමි. | අරමුදලේ වැඩසටහන් සඳහා පූර්ව සැලැස්මක් සකස් කලයුතු අතර එම සැලැස්මට අනුව කාර්යසාධනය ඇගයීමට කාර්යසාධන දර්ශක හඳුන්වා දී ඇගයීම් සිදු කොට ප්‍රගතිය වාර්තා කළ යුතුය. |
| (ආ) සිරකරුවන් නිදහස්කල පසු ඔවුන්ගේ පුනරුත්ථාපනයට උපකාරවන පශ්චාත්භාර සේවා සඳහා අරමුදලෙන් කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකරන ලද නමුත් අරමුදලේ පරමාර්ථයන් යම්තාක් දුරකට හෝ ඉටු කර ගැනීම සඳහා බාහිර ආයතන හා ස්වේච්ඡා සංවිධානවල අනුග්‍රහයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. | නිදහස ලබන සිරකරුවන්ගේ පුනරුත්ථාපනයට උපකාරවන පශ්චාත්භාර සේවා සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක විය යුතුය. |
| (ඇ) වර්ෂ 06 කට වඩා වැඩි කාලයක සිට පැවත එන බෝගම්බර බන්ධනාගාරයේ සිර ශ්‍රමයට වෙනත් දෙපාර්තමේන්තුවලින් අයකර ගත යුතු රු.7,460 ක ශේෂයක් හා ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද බදුල්ල බන්ධනාගාරයේ සිර ශ්‍රමයට දෙපාර්තමේන්තුවෙන් අයකර ගත යුතු රු.8,400 ක ශේෂයන් මෙතෙක් අයකර ගෙන නොතිබුණි. | සිර වේතන අනිවාර්ය අයකර ගතයුතු බෝගම්බර බන්ධනාගාරයට අදාළ රු.7,460 ක ශේෂයක් පවතින අතර තවමත් එය අයකර ගැනීමට නොහැකි වී ඇති නිසා එම ශේෂය ඉදිරියේ දී කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු කරන බව විගණනයේ දී දැනුම් දෙමි.<br><br>සිර වේතන අනිවාර්ය අයකර ගතයුතු බදුල්ල බන්ධනාගාරයට අදාළ රු.8, 400 ක ශේෂයක් පවතින අතර එය 2017 වර්ෂයට අදාළව ලැබිය යුතු ආදායමකි. 2018 වර්ෂයේ දී එම මුදල බන්ධනාගාර | අයකරගත යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ආයතනය වෙත ලැබී ඇති අතර මෙය 2022 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | |
| (ඈ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන මීගමුව බන්ධනාගාරයෙන් ආපසු අයකර ගත යුතු රු.1,880 ක අත්තිකාරම් මුදලක් අයකර නොගෙන දිගින් දිගටම ගිණුම්වල ඉදිරියට ගෙන එමින් තිබුණි. | මීගමුව බන්ධනාගාරයේ ආපසු අයකර ගත යුතු අත්තිකාරම් රු.1,880 ක වටිනාකම් සම්බන්ධයෙන් තොරතුරු හා ලේඛන පරීක්ෂා කර ඒ සඳහා නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව මෙමගින් දැනුම් දෙමි. | අයකරගත යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1. වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877 (2)(ඈ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාළව කාර්යසාධන වාර්තා නිවැරදිව සකස් කර මූල්‍ය ප්‍රකාශන පිටපත් සමග රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට හා පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් තබාගත් බව දන්වමි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**4.2. අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877(1)(ඇ) ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් අයවැය ලේඛනය සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු අතර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවත් එසේ යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකරන ලද නමුත් අරමුදලේ පරමාර්ථයන් යම්තාක් දුරකට හෝ ඉටු කර ගැනීම සඳහා බාහිර ආයතන හා ස්වේච්ඡා සංවිධානවල අනුග්‍රහයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.